MONDAY, 30 MAY 2016

(/)



(/component/banners/click/7)

BREAKING NEWS < > හන්තාන ඉරිතලලා : 2000 කගේ ජීවිත අවදානමේ - Monday, 30 May 2016 Search ...

(/media/k2/items/cache/c461475360f84757c38c11aa84163d25_XL.jpg)



# ලංකාවේ සමනලුන් ගැන මාර්ගෝපදේශයක් Featured

30 May 2016

(/news/item/14216-landmark-guide-to-lankan-butterflies?tmpl=component&print=1) (/component/mailto/?tmpl=component&template=shaper_newsplus&link=b14221d0d400a1f24fb6f8406aed5a50e4e25b49)

Share Like 1 Tweet Share Share 0

'ශ්‍රී ලංකාවේ සමනල සංහතිය' මැයෙන් සවිස්තරාත්මක පොතක් එළිදැක්වීම කොළඹ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේදී ජූනි 02 වැනිදා සවස 6.00ට සිදු කෙරේ.

සමනලුන් පිළිබඳ තොරතුරු රැස්කරන කීර්තිමත් විද්වතෙකු වන ආචාර්ය ජෝර්ජ් මයිකල් වැන් ඩර් පෝර්ටෙන් සහ ඔහුගේ බිරිඳ නැන්සි විසින් රචිත මෙම පොතෙන් මෙරට වෙසෙන සියලූම සමනලූන්ගේ (ප්‍රභේද 247)ජීවිත පිළිබඳ සාකච්ඡා කෙරේ.

ශ්‍රී ලංකාවේ සමනලූන් පිළිබඳ විවිධ සහ විශේෂිත අධ්‍යයනවල ඉතිහාසය සහ ඔවුගේ ජීවන තොරතුරු, වර්ගීකරණය, රූපාකාරය සහ පැතිර ඇති ආකාරය සමග ඡායාරූප

නවතම පුවත්

3,000 කින් වර්ණවත් වන පිටු 424 කින් එය සමන්විත වේ.

වනාන්තර එළිපෙහෙළි කිරීම, කෘෂිකර්මාන්තයට විශාල වශයෙන් රසායනික භාවිතය සහ ආක්‍රමණකාරී වල්පැලෑටි නිසා වාසස්ථාන අහිමි වීමේ තර්ජනයට ලක්ව සිටින ශ්‍රී ලංකාවේ සමනලුන් සංරක්ෂණය වෙනුවෙන් වන මූලික තොරතුරු ද එහි අඩංගුව ඇත.

වසර 2014 දී ප්‍රකාශිත ශ්‍රී ලංකාවේ සමනලුන් සංරක්ෂණය කිරීමේ ක්‍රියාකාරි සැලැස්මෙහි සංස්කාරකවරයා මෙන්ම 2012 දී සිදු කළ වඳවී යෑමේ තර්ජනයට මුහුණපා සිටින සමනලුන් පිළිබඳ ජාතික ව්‍යාපෘතියේ මූලිකත්වය ගෙන ක්‍රියා කළ විද්‍යාඥයා වූයේ ද ආචාර්ය මයිකල් වැන් ඩර් පෝර්ටෙන් ය.

එළිදැක්වීමේ අවස්ථාවේදී මෙම පොත රු. 6,200 ක විශේෂ මිලකට ලබාගත හැක.

**(තොරතුරු සඳහා: ආචාර්ය මයිකල් වැන් ඩර් පෝර්ටෙන්, විද්‍යුත් තැපැල lepodonbooks@gmail.com (mailto:lepodonbooks@gmail.com),** ජංගම **දුරකථනය: 077 316 5395)**



font size decrease font size increase font size

Rate this item

1
2
3
4
5

(0 votes)

Tweet

Like One person likes this.

G+1

More in this category: « ඉබ්බෙක්ට කකුල් වෙනුවට රෝද කකුල් පූට්ටු වෙයි (/news/item/14215-turtle-wheel-leg-england) මනෝ විශ්ලේෂණය සිනමාව කියවන මෙවලමක්ද? » (/news/item/14217-cinema-reading-tool-of-psychoanalysis)

Share / Save (https://www.addtoany.com/share#url=http%3A%2F%2Fwww.sinhala.srilankamirror.com%2Fnews%2Fitem%2F14216-



(/news/item/14220-gaththanta-yatath-wenne-ne)



(/news/item/14219-hanthana-kadu-w-2000-and)



(/news/item/14218-employers-of-workers-postponed-two-weeks)



(/news/item/14217-cinema-reading-tool-of-psychoanalysis)